**දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල සංවර්ධන ව්‍යාපෘතිය - 2016**

-------------------------------------------------------------------------------

දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල සංවර්ධන ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය (ශ්‍රීලංර) හා වර්තමානයේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය ලෙස හැඳින්වෙන එවකට ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපන් බැංකුව අතර 2006 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී 87 දරන ණය ගිවිසුමේ 4(8) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය,වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, මඩකලපුව, කල්ලඩි හි නව පාලමක් ඉදිකිරීම ඇතුළත්ව අක්කරෙයිපත්තු සහ තිරුක්කොන්ඩියාමඩු අතර අනුහානි වූ හා කොටසක් සුනාමි බලපෑමට ලක් වූ ජාතික මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම මඟින් ව්‍යාපෘති ප්‍රදේශ ඇතුළත හා පිටත ප්‍රදේශවලට ප්‍රවේශය වැඩිදියුණු කිරීම මඟින් ඌන සංවර්ධිත නැගෙනහිර ගෘහ ආර්ථික පදනම ප්‍රතිස්ථාපනය කිරීම හා ප්‍රාදේශීය ආර්ථික අසමානතා අඩුකිරීමයි. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 7,690කට සමාන ජපන් යෙන් මිලියන 5,569 ක් වූ අතර ඉන් රු.මිලියන 6,158 කට සමාන ජපන් යෙන් මිලියන 4,460 ක් මූල්‍ය යනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2010 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2013 සැප්තැම්බර් 15 දක්වා දීර්ඝ කරන ලදි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 31 දක්වා සිදු කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

(ඔ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව .

## 2. මූල්‍ය ප්‍රකාශන
---------------

### 2.1 මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව සහ,

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙහි කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජජාසනි | 4,460 | 6,158 | - | - | 4,990 | 6,401 |
| ශ්‍රීලංර | 1,109 | 1,532 | - | - | 870 | 1,113 |
| එකතුව | 5,569 | 7,690 | - | - | 5,860 | 7,514 |

### 3.2 භෞතික ප්‍රගතිය

නැගෙනහිර පළාතේ ජාතික මාර්ග කිලෝමීටර් 100 ක් ප්‍රතිසංස්කරණය කිරීම හා මඩකලපුව, කල්ලඩි හි නව පාලම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 3,806.80 ක ඇස්තමේන්තුගත පිරිවැයකට විදේශීය කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි. එබැවින් කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ හා මඩකලපුව - තිරුක්කොන්ඩියාමඩු - ත්‍රිකුණාමලය මාර්ගයේ කිලෝමීටර් 99 ක ප්‍රතිසංස්කරණ වැඩ රු.මිලියන 3,102.88 ක මුළු පිරිවැයකට කොන්ත්‍රාත්කරු විසින් නිම කර තිබුණි. නව පාලම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු.මිලියන 813.47 ක ඇස්තමේන්තුගත පිරිවැයකට රාජ්‍ය සංස්ථාවකට නැවත ප්‍රදානය කර තිබූ අතර 2013 වර්ෂයේදී රු.මිලියන 1,113.72 ක මුළු පිරිවැයකට නිම කර තිබුණි. ජාතික මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා යෙදී සිටි විදේශීය කොන්ත්‍රාත්කරු අවසාන ගෙවීම් නිරවුල් කිරීම මත හා මිල ඉහළ යාම් හේතුවෙන් වූ ආරාවුල් මත තීරක විනිශ්චය නඩුවක් ගොනුකර තිබූ අතර රු.මිලියන 593.43 ක මුදලක් ඉල්ලා තිබුණි. ශ්‍රී ලංකා රජයට ලැබී තිබුණු දායකයෙන් රු.මිලියන 3.28 ක මුදලක් තීරක විනිශ්චය ක්‍රියාවලිය සඳහා ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි.

### 3.3 මතභේදයට තුඩු දෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් 2016 අගෝස්තු 25 දින කරන ලද නියෝගය අනුව, නියෝගයේ දින සිට දින 100 ක් ඇතුළත ප්‍රමාද ගෙවීම් සඳහා පොලී සහිතව පවතින රේටයට රු.මිලියන 336.62 ක මුදලක් ව්‍යාපෘතිය විසින් ගෙවිය යුතු විය. කෙසේ වුවද, මෙම ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීම සඳහා 2016 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) මාගේ පෙර වර්ෂය සඳහා වූ වාර්තාවේ සඳහන් කරන ලද පරිදි, ව්‍යාපෘති කටයුතු වලින් උපයන ලද ලාභවලින් කොන්ත්‍රාත්කරු විසින් ගෙවන ලද රු.මිලියන 9.22 ක් වූ ආදායම් බදු ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. තවද, උපදේශකගේ පාරිශ්‍රමිකය මත රු.මිලියන 16.55 ක් වූ උපයන විට ගෙවීම් බදු ද 2014 වර්ෂයේදී ගෙවා තිබුණි. කෙසේ වුවද, නීත්‍යානුකූල නොවූ ආකාරයකින් සිදුකරන ලද එවැනි වියදම් අයකර ගැනීමට ව්‍යාපෘතිය විසින් 2016 දෙසැම්බර් 31 දක්වා කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.